# පාලි සහ බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය

## කැලණිය විශ්වවිද්‍යාලය

# අධ්‍යක්ෂ තනතුර

කැලණිය විශ්වවිද්‍යාලයේ පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනයේ අධ්‍යක්ෂ තනතුර සඳහා 2025.07.28 දින දක්වා ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලබයි. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 63 ට අඩු විය යුතුය.

අපේක්ෂිත අයදුම්කරු පශ්චාත් උපාධි සුදුසුකම්වලින් සහ පරිපාලන පළපුරුද්දකින් සමන්විත විය යුතුය. මෙය, පාලි සහ බෞද්ධ අධ්‍යයන කටයුතු වෙනුවෙන් ශ්‍රී ලංකාවේ පවත්නා ප්‍රමුඛතම පශ්චාත් උපාධි ආයතනයයි. මෙමගින් පශ්චාත් උපාධි ඩිප්ලෝමාවේ සිට දර්ශනසූරි උපාධිය දක්වා විහිදෙන පශ්චාත් උපාධි පාඨමාලා හැදෑරීමට දේශීය හා විදේශීය සිසුන්ට අවස්ථාව සලසා දෙයි.

තෝරාගනු ලබන අයදුම්කරු ශාස්ත්‍රීය නායකත්වය ලබා දීම සහ ආයතනය තුළ ක්‍රියාත්මක වන අනෙකුත් සංවිධාන සහ වෙනත් ජාතික හා ජාත්‍යන්තර අධ්‍යයන ආයතන සමඟ සක්‍රීය සබඳතා ඇතිකර ගැනීම සම්බන්ධයෙන් වගකීම දරනු ඇත. ඔහුට/ඇයට විශිෂ්ට අන්තර් පුද්ගල සබඳතා පිළිබඳ නිපුනතාවක් සහ ප්‍රජාව කෙරෙහි ආයතනයේ කැපවීම පිළිබඳ අවබෝධයක් තිබිය යුතුය. දුරස්ථ අධ්‍යාපන මාදිලියේ ඉගැන්වීමේ/ඉගෙනීමේ අත්දැකීම් අතිරේක ප්‍රයෝජනයක් වනු ඇත.

1979 අංක 8 දරන පාලි සහ බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතන ආඥා පනතට අනුව, අධ්‍යක්ෂවරයා පූර්ණකාලීන නිලධරයෙකු වන අතර, ප්‍රධාන විධායක නිලධරයා, ප්‍රධාන අධ්‍යයන නිලධරයා සහ ආයතනයේ ගිණුම්කරණ නිලධරයා ද වේ. අධ්‍යක්ෂවරයා, කළමනාකාර මණ්ඩලයේ සභාපතිවරයා වන අතර, ආයතනයේ අධ්‍යයන කමිටුවල නිල බලයෙන් පත් කරන ලද සාමාජිකයෙකි. පත් කරන ලද අධ්‍යක්ෂවරයා පත්වීමේ දින සිට වසර තුනක කාලයක් හෝ වයස අවුරුදු 65 සම්පූර්ණ වන තෙක් හෝ මින් කවර හෝ අවස්ථාවලින් පළමුව එළඹෙන කාලසීමාව තෙක් එම ධුරය දැරිය යුතුය.

පශ්චාත් උපාධි ශිෂ්‍ය පුහුණුව සහ කළමනාකරණය පිළිබඳ අත්දැකීම් සහිත බෞද්ධ අධ්‍යයන සම්බන්ධයෙන් කීර්තිමත් ජ්‍යෙෂ්ඨ විද්වතුන් හට ප්‍රමුඛතාව ලබාදෙනු ඇත.

විෂයය ප්‍රවීණ, ශාස්ත්‍රීය විශිෂ්ට පර්යේෂණ සහ කළමනාකරණ කුසලතා සහිත මෙන්ම වර්තමාන සහ අනාගත අභියෝගවලට මුහුණ දීමේ දැක්මක් සහිත පුද්ගලයෙකු කළමනාකාර මණ්ඩලය අපේක්ෂා කරයි.

අධ්‍යක්ෂවරයා U - AC 5 පරිමාණයේ වැටුපක් සහ තනතුරට අදාළ දීමනා ලබා ගැනීමට සුදුසුකම් ලබයි. දැනට රාජ්‍ය සේවයේ යෙදී සිටින සහ ඉහත වැටුප් පරිමාණයේ මූලික වැටුප ඉක්මවන වැටුපක් ලබන අය සමාන වැටුප් තලයක පිහිටුවනු ලබනු ඇත. 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ අර්ථ නිරූපණය කර ඇති පරිදි, අයදුම්කරු ආචාර්යවරයෙකු නම්, ඔහුට/ඇයට මූලික වැටුපෙන් 124% + රු. 13,300/- ක අධ්‍යයන දීමනාවක් ගෙවනු ඇත.

අධ්‍යක්ෂවරයාට ලබා දෙන අනෙකුත් ප්‍රතිලාභ වන්නේ:

- ⋆ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා අනුමත ප්‍රවාහන දීමනා.
- ⋆ මූලික වැටුපෙන් 12% ක සංග්‍රහ දීමනාව.
- ⋆ විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට (UPF) දායකත්වය.
- ⋆ සේවා නියුක්තයන්ගේ භාර අරමුදලට (ETF) දායකත්වය.

අයදුම්පත සමඟ පහත සඳහන් ලියකියවිලි ඉදිරිපත් කළ යුතුය.

- ▪ උපන් දිනය ඇතුළත් අයදුම්කරුගේ සම්පූර්ණ ජීවදත්ත පත්‍රිකාවක් (උප්පැන්න සහතිකයේ සහතික කළ පිටපතක් අමුණා තිබිය යුතුය).
- ▪ ආයතනයේ සංවර්ධනය සඳහා වන දැක්ම පිළිබඳ ප්‍රකාශයක් සහ අධ්‍යක්ෂ තනතුරට පත් කළහොත්, අයදුම්කරු විසින් අත්කර ගැනීමට යෝජනා කරන කරුණු පිළිබඳ කෙටි විස්තරයක්.
- ▪ අයදුම්කරු තනතුරට පත් වුවහොත් ඔහු/ඇය නිදහස් කළ හැකිද යන්න දැක්වෙන සේවායෝජකයාගේ ලිපියක් (මෙය පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකා, රාජ්‍ය සේවය, සංස්ථා සහ ව්‍යවස්ථාපිත ආයතන සහ අනෙකුත් උසස් අධ්‍යාපන ආයතනවල අයදුම්කරුවන්ට අදාළ වනු ඇත.)

සාර්ථක අයදුම්කරුවෙකු ලෙස තෝරාගෙන ඇත් නම්, අයදුම්කරු ආයතනය පිළිබඳ ඔහුගේ / ඇයගේ දැක්ම විධිමත් ලෙස කළමනාකාර මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමක් කළ යුතුය. අධ්‍යක්ෂවරයා පත් කිරීම සඳහා වන තේරීමේ ක්‍රියාවලිය, පත් කිරීමේ ක්‍රමවේදය සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කර ඇති 2024.01.01 දිනැති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2024 හි දක්වා ඇති ආකාරයට සිදු කරනු ලැබේ.

අයදුම්පත්, නියෝජ්‍ය ලේඛකාධිකාරී, පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය, 977/5, යුනිවර්සිටි ඩ්‍රයිව්, බුළුගහ හන්දිය, නුවර පාර, කැලණිය යන ලිපිනයට 2025.07.28 වන දින ප.ව. 3.00 හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් හෝ මුද්‍රා තැබූ ලියුම් කවරයක බහා අතින් භාරදීමෙන් හෝ ලැබීමට සැලැස්විය යුතුය. තනතුරේ නම ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ "අධ්‍යක්ෂ තනතුර/PGIPBS" ලෙස සඳහන් කළ යුතුය.

අසම්පූර්ණ, අවශ්‍යතාවයන්ට අනුකූල නොවන හෝ අවසන් දිනට පසුව ලැබෙන හෝ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ඊට අමතරව, අයදුම්පත සහ අදාළ ලිපි ලේඛන මෘදු පිටපතක් ලෙස PDF ආකෘතියෙන් sjayasekara@kln.ac.lk යන විද්‍යුත් තැපෑල ඔස්සේ යොමු කළ යුතුය. වැඩිදුර විස්තර 2024 ජනවාරි 01 දිනැති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2024 වෙතින් ලබා ගත හැකිය. (මෙම චක්‍රලේඛය www.ugc.ac.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැකිය.)

එල්.ඒ. සුමිත් ජයසේකර
නියෝජ්‍ය ලේඛකාධිකාරී හා කළමනාකාර මණ්ඩලයේ ලේකම්
පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය
977/5, යුනිවර්සිටි ඩ්‍රයිව්
බුළුගහ හන්දිය
නුවර පාර
කැලණිය

2025 ජුලි 04 වැනිදා සිකුරාදා

N & G Ads